# නීතිය පිළිබඳ විමර්ශනයක්

කන්දෙගොඩ විමලධම්ම හිමි

## හැඳින්වීම

නීති ශබ්දය නී + නයෙ මඟපෙන්වීමෙහි (to guide) ධාතුවෙන් නිපන් ශබ්දයකි. ඉංග්‍රීසි භාෂාවෙන් Law යනුවෙන් හැඳින්වෙන්නේ මෙම ශාස්ත්‍රය පිළිබඳ සංඥා නාමයයි. එහෙත් මෙය පැරණි ග්‍රීක් බසින් ලියනු ලැබ ඇත්තේ 'Lagu' යන වචනයේ ඉතිහාසය පිරික්සීමෙන් ඒ බව මනාව පැහැදිලි වේ. මෙම 'Lagu' ශබ්දය 'Lag' බවට පරිවර්තනය විය. එයින් අදහස් කරනු ලබන්නේ සංයුක්ත වූ යමකි. මෙම විශේෂණය 'Legal' යනුවෙන් සකස් වී තිබේ. ඉංග්‍රීසි බසට මෙම රූපය ලැබී ඇත්තේ ලැටිනම් (Latinum) ප්‍රදේශයේ ජනතාවගේ බස වූ ලතිනයට අයත් Lex යන්න මත පදනම් වූ "Legilis" යන්නෙනි (Curzon,1979:3). එයින් අදහස් කෙරෙන්නේ Law යන්නයි. වර්තමානයේ අප ව්‍යවහාර කරනු ලබන "නීතිය" යන වචනය උපයෝගී කරගනු ලබන්නේ ඉංග්‍රීසි බසෙහි හඳුන්වා දී ඇති Law යන වචනය උදෙසා ය. අද නීතිය නමැති වචනය සම්මත වී ඇති බව සැබෑ නමුදු ඓතිහාසික වශයෙන් විමසා බැලීමේ දී ඉන් ඉදිරිපත් කෙරී ඇත්තේ නීතිය හා දේශපාලන දර්ශනය බව නීති ශාස්ත්‍ර ග්‍රන්ථ වූ පංචතන්ත්‍ර, හිතෝපදේශ ආදි කෘතීන්ගෙන් පැහැදිලි වෙයි (ශර්මා විෂ්ණු,1957: පරි.1). මඟපෙන්වීම යන අරුත් ඇති මේ වචනයෙන් ආරම්භයේ දී අදහස් කරන ලද්දේ දේශපාලන දර්ශනය සහ සදාචාරය (Philosophy and morality) වුව ද අද දින එය රාජ්‍යයේ පවතින උසාවි මඟින් ක්‍රියාත්මක වන නීති ශාස්ත්‍රය හැඳින්වීම සඳහා උපයෝගීකරගනු ලබයි. Law යන ශබ්දය පිළිබඳ දීර්ඝ පරිණාමය ඉතා සැකෙවින් ගෙනහැර දැක්වීමක් මෙහි දී ඉදිරිපත් කොට ඇත.

## වෝහාර විධි

Laws (නීති) යන ඉංග්‍රීසි භාෂාමය පාරිභාෂික ශබ්දය සඳහා සිංහල භාෂාවෙහි උපයෝගී විය යුතු උචිත ශබ්දය වෝහාර් විධි හෙවත් ව්‍යවහාර විධි යන්න බව ප්‍රකාශ කරමු. මුල් යුගයේ දී භාරතයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද නීති ශාස්ත්‍රය යන අධ්‍යයනය සඳහා උපයෝගී වූයේ ව්‍යවහාර විධි යන ශබ්දයයි (ව්‍යවහාර (වි+අව+හෘ (ගෙනයෑමෙහි). ඒ බව අශෝක අධිරාජයා විසින් ප්‍රතිෂ්ඨාපිත ශිලා ලේඛනයන "වියෝහළ සමතා" යන පාරිභාෂික ශබ්දයෙන් පෙනීයයි. වියෝගල යනු ව්‍යවහාර යන සංස්කෘත ශබ්දයේ ප්‍රාකෘත ස්වරූපයයි. මෙය ද්‍රවිඩ භාෂාවෙහි "තෙසවලමෙ" යන්නෙහි පැනෙන "වළමෙ" යන්න අපට සිහිකරවයි. වියෝහළ සමතා යන්නෙන් අර්ථවත්වන්නේ නීතියේ දී සැමටම සමානව යුක්තිය ඉටු කිරීමය. මේ නම් අන් කිසිවක් නොව සාධාරණත්වය (equity) නමැති සංකල්පයයි. ලක්දිව රාජ්‍ය ප්‍රාප්ත වූ වෝහාරික තිස්ස රජතුමා පිළිබඳ මහාවංශයේ "වොහාර" යන පාලි වචනය යොදා ඇත. ඉතා දරුණු හිංසා පීඩාගෙන දෙන ව්‍යවහාර විධි නැති කොට හිංසා පීඩාදියෙන් මුක්ත ව්‍යවහාර විධි අනුගමනය කළ නිසා මොහුට මේ නම දී ඇති බව පෙනේ (මහාවංසය,1959:පරි.36,ගාථාව28, ඨපෙසි සො හි වොහොරං